# ආරක්ෂක අමාත්‍යාංශය

# ලංසු ආරාධනයයි

## SIS ලේඛන කළමනාකරණ පද්ධතියේ දෘඪාංග සහ මෘදුකාංග සැපයුම, ස්ථාපනය, වින්‍යාසකරණය සහ නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය

## IFB අංකය : MOD/FD/PD/16/II-1/2021

1. ආරක්ෂක අමාත්‍යාංශය වෙනුවෙන් අමාත්‍යාංශයීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපතිවරයා, ලේඛන කළමනාකරණ පද්ධතියේ දෘඪාංග සහ මෘදුකාංග සැපයුම, ස්ථාපනය, වින්‍යාසකරණය සහ නඩත්තුව සඳහා ප්‍රසම්පාදනය සඳහා ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු කැඳවා සිටී.

2. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ තුළ දක්වා ඇති පරිදි ජාතික තරගකාරීත්ව ලංසු පටිපාටිය අනුව ලංසු කැඳවීම සිදු කෙරෙනු ඇත.

3. ඇගයීම සඳහා සලකා බැලීමටත් කොන්ත්‍රාත්තුව පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමටත් ලංසුකරුවා දෘඪාංග සහ/ හෝ මෘදුකාංග යටතේ ඇති සියලු අයිතම සඳහා ලංසු ඉදිරිපත් කළ යුතුය. අර්ධ ලංසු ප්‍රතිචාරාත්මක නොවන ලෙස සලකා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

4. තොරතුරු තාක්ෂණ දෘඪාංග, මෘදුකාංග සහ ජාලකරණ යටිතල පහසුකම් සැපයීම, භාරදීම, ස්ථාපනය සහ ක්‍රියාත්මක කිරීම කොන්ත්‍රාත්තුව බලාත්මක වන දිනයේ සිට **දින එකසිය අසූවක් (180)** වන ක්‍රියාත්මක කිරීමේ කාලය තුළ සම්පූර්ණ කළ යුතුය.

5. විදේශ ලංසුකරුවන්ට ලංසු ඉදිරිපත් කිරීමට ඉඩ නොලැබේ.

6. ශ්‍රී ලංකාව තුළ ලියාපදිංචි සමාගමක් විය යුතු අතර, අවසන් වර්ෂ දහයක (10) කාලය තුළ ක්‍රියාත්මක විය යුතු ය.

7. කොන්ත්‍රාත්තු පිරිනැමීම සඳහා සුදුසුකම් ලැබීමට අවශ්‍ය වන අනෙකුත් අවම සුදුසුකම්:

   a. Microsoft බලපත්‍ර සහිත විසඳුම් සපයන්නෙකු විය යුතු ය.

   b. ආරක්ෂාව සහ දත්ත මධ්‍යස්ථානය ඇතුළු අවම වශයෙන් රන් නිපුණතා 12 ක් වත් තිබිය යුතු ය

   c. පසුගිය වසර පහ තුළ **රු.මි. 120** ට නොඅඩු වටිනාකමින් යුතු, මෙම ව්‍යාපෘතියේ ස්වභාවයට සහ සංකීර්ණතාවට සමාන ඉලෙක්ට්‍රොනික දත්ත මධ්‍යස්ථාන ස්ථාපනය සම්බන්ධ කොන්ත්‍රාත්තු පහක්වත් (05) සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

   d. ලංසුකරුවන් විසින් යෝජනා කරන සියලුම සන්නාම/ නිපැයුම් ශ්‍රී ලංකාව තුළ අවම වශයෙන් වසර පහක් (05) වත් ඉතිහාසයක් සහිත විය යුතු ය.

   e. කොන්ත්‍රාත්තු අත්තිකාරම් ගෙවීම්වලට අමතරව, **රු. මි. 50** ක මුදල් ප්‍රවාහය සැපිරීම පිණිස ද්‍රවශීල වත්කම්, ණය නොමැති මූර්ත වත්කම්, ණය දාම සහ වෙනත් මූල්‍ය මාර්ග වැනි මූල්‍ය සම්පත් තිබිය යුතු ය, නැතහොත් ඒ වෙත ප්‍රවේශය තිබිය යුතු ය.

   f. ප්‍රධාන කාය මණ්ඩලය යෝජිත නිෂ්පාදන පිළිබඳ සහතික ලත් ඉංජිනේරුවරුන්ගෙන් යුක්ත විය යුතු ය.

   g. 24 X 7 පුරා පද්ධති දෘඪාංග සහ මෘදුකාංග සඳහා තාක්ෂණික සහය/ උපකාරක මධ්‍යස්ථාන පැවතිය යුතු ය.

   h. පද්ධතිය සඳහා යෝජිත උපකරණ ස්ථාපනය කිරීමට නිෂ්පාදකයාගේ/ දේශීය නියෝජිතයාගේ බලය ලබා දීම තිබිය යුතු ය.

   i. පසුගිය වසර 3 තුළ විගණනය කළ මූල්‍ය වාර්තා අනුව **රු.මි. 200** ක අවම සාමාන්‍ය වාර්ෂික පිරිවැටුමක් තිබිය යුතු ය.

8. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට, තොරතුරු තාක්ෂණ ප්‍රධානී වෙතින් **2021/10/11** සිට **2021/11/01** දක්වා කාලය තුළ (දුර : **071-3680880** /ඊමේල් : **admin@sis.gov.lk**) වැඩ කරන දිනයන් හි **පෙ.ව.8.30 සිට ප.ව.4.00** දක්වා වැඩි දුර තොරතුරු ලබා ගත හැකි ය.

9. ඉංග්‍රීසි භාෂාවෙන් සැකසුණු සම්පූර්ණ ලංසු ලේඛන කට්ටලයක් මිල දී ගත හැකි අතර, උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට **රු. විසිපන්දහසක් (රු. 25,000.00)** වන නැවත ගෙවනු නො ලබන ගාස්තුවක් ගෙවා ප්‍රධාන මූල්‍ය නිලධාරී I, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිත ඉල්ලීමක් එවීමෙන් **2021/10/11** දින සිට ලංසු ලේඛන පරීක්ෂා කළ හැකි ය. ගෙවීමේ ක්‍රමය වන්නේ මුදල් මගින් ගෙවීමයි.

10. **2021/10/18** දින **පැය 1000** ට, කොළඹ 07, බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාමර අංක 104 දී පූර්ව ලංසු රැස්වීම පැවැත්වෙනු ඇත.

11. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු ලේඛනය, මෘදු පිටපතක් සමගින් **2021/11/02 පෙ.ව.11.00** ට හෝ ඊට පෙර ප්‍රධාන මූල්‍ය නිලධාරී I කාර්යාලය, 2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලැබෙන්නට සැලැස්විය යුතු ය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ.

12. සෑම ලංසුවක්ම, මහ බැංකුව විසින් අනුමත කළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් වෙතින් කොන්දේසි විරහිත බැඳුම්කරයක් ලෙස නිකුත් කරන ලද, **2021/02/28** තෙක් වලංගු (ලංසු අවසන් දිනයේ සිට ලංසු විවෘත කරන දින ද ඇතුළුව දින 119 ක්) **රුපියල් 2,500,000.00** ක් වටිනා "**ලංසු සුරක්ෂණයක්**" සමග ඉදිරිපත් කළ යුතු ය. ලංසු ආරක්ෂණයේ ප්‍රතිලාභියා විය යුත්තේ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා ය.

13. ලංසුව, ලංසු භාර ගැනීමේ අවසන් දිනයේ සිට දින **අනූ එකක් (91)** වලංගු විය යුතු ය.

14. ලංසු භාර ගැනීම අවසන් වූ වහාම, ප්‍රධාන මූල්‍ය නිලධාරී I, 2 වන මහල, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ලිපිනයේදී ලංසුකරුවන්ගේ බලයලත් නියෝජිතයින් ඉදිරියේදී ලංසු විවෘත කරනු ලැබේ.

15. ලංසුව විවෘත කිරීමට අවම වශයෙන් දින තුනකට (03) පෙර ටෙන්ඩරය විවෘත කිරීමට සහභාගි වන පුද්ගලයාගේ නම, ජාතික හැඳුනුම්පත් අංකය/ ගමන් බලපත්‍ර අංකය ලංසුකරුවන් විසින් ප්‍රධාන මූල්‍ය නිලධාරී I, ආරක්ෂක අමාත්‍යාංශය, ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ වෙත ලිඛිතව දැන්විය යුතුය.

16. ලංසු සූදානම් කිරීම හෝ භාරදීම සම්බන්ධයෙන් ලංසුකරුවන්ට වැය වන කිසිදු වියදමක් සම්බන්ධව ආරක්ෂක අමාත්‍යාංශය වග කියනු නොලැබේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**ආරක්ෂක අමාත්‍යාංශය,**
**ආරක්ෂක මූලස්ථාන සංකීර්ණය,**
**ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**